ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

1984 අංක 24 දරන
නාවිකයන්ගේ සුභසාධක අරමුදල
පනත

[සහතිකය සටහන් කළේ 1984 ජූනි මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1984 ජූනි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ
II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : රු. 1.20 යි　　　　තැපැල් ගාස්තුව : ශත 60 යි

1984 අංක 24 දරන නාවිකයන්ගේ සුභසාධක අරමුදල පනත

[සහතිකය සටහන් කළේ 1984 ජූනි මස 20 වන දින.]

එල්. ඩී.—ඕ. 15/82

නාවිකයන්ගේ සුභසාධක අරමුදල යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1984 අංක 24 දරන නාවිකයන්ගේ සුභසාධක අරමුදල පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මේ පනත අදාළ වන ආකාරය.

2. (1) මේ පනතේ විධිවිධාන, අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකාවේ දී දේශීය හෝ විදේශීය නැව් අයිතිකරුවකු හෝ අයිතිකරුගේ අනුයෝජිතයකු සමඟ ප්‍රතිඥා ගිවිසුම් අත්සන් කරන සෑම ශ්‍රී ලාංකික නාවිකයකුටම අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇතද ආණ්ඩුවේ අනුමැතිය ලත් අර්ථසාධක අරමුදල් ක්‍රමයකට දෙදෙනාම දායක වන යම් නාවිකයකුට හෝ ඒ නාවිකයාගේ සේවා යෝජකයාට මේ පනත අදාළ නොවිය යුතු ය.

I වන කොටස

නාවිකයන්ගේ සුභසාධක අරමුදල් මණ්ඩලය පිහිටුවීම

නාවිකයන්ගේ සුභසාධක අරමුදල පිහිටුවීම.

3. (මෙහි මින් මතු “ අරමුදල ” යනුවෙන් සඳහන් කරනු ලබන) නාවිකයන්ගේ සුභසාධක අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

නාවිකයන්ගේ සුභසාධක අරමුදල් මණ්ඩලය පිහිටුවීම.

4. (1) (මෙහි මින් මතු “ මණ්ඩලය ” යනුවෙන් හඳුන්වනු ලබන) නාවිකයන්ගේ සුභසාධක අරමුදල් මණ්ඩලය යනුවෙන් හැඳින්වෙන මණ්ඩලයක්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නිවේදනයක් මගින් නියම කරනු ලබන යම් දිනයක සිට පිහිටුවනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය, අඛණ්ඩ පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර එම නමින් එය විසින් නඩු පැවරීම ද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

මණ්ඩලයේ සාමාජිකයන්.

5. (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන මෙහි පහත සඳහන් සාමාජිකයන් පස් දෙනාගෙන් මණ්ඩලය සමන්විත විය යුතු ය :—

(අ) නාවික කටයුතු විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබූ එක් සාමාජිකයෙක් ;

(ආ) වෙළෙඳ නැව් අධ්‍යක්ෂවරයා ;

(ඇ) නාවික කටයුතු විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරීවරයා ;

(ඈ) කම්කරු විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබූ එක් සාමාජිකයෙක් ; සහ

(ඉ) නාවිකයන් නියෝජනය කිරීමට එක් සාමාජිකයෙක්.

(2) මණ්ඩලයේ සභාපතිවරයා, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම අවස්ථානුකූල යයි අමාත්‍යවරයා අදහස් කරන්නේ නම්, ඔහු විසින්, හේතු නොදක්වා එසේ ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) ධුරයෙන් ඉවත් කරනු ලැබූ මණ්ඩලයේ සාමාජිකයකු මණ්ඩලයේ සාමාජිකයකු ලෙස නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සෙක් නොවන්නේ ය.

(5) අමාත්‍යවරයා අමතා යවන ලිඛිත සංදේශයක් මගින් මණ්ඩලයේ යම් සාමාජිකයකුට කවර අවස්ථාවක වුවද සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ මණ්ඩලයේ සභාපතිවරයාට නැතහොත් කවර හෝ සාමාජිකයකුට ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වුවහොත්, ඔහු වෙනුවට වැඩ බැලීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(7) මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය හිස් කළහොත් මිස මණ්ඩලයේ සෑම සාමාජිකයකුම, තුන් අවුරුදු කාලයක් ධුරය දරන්නේ ය. කාලය ඉකුත් වීමෙන් ධුරය හිස් කරන මණ්ඩලයේ යම් සාමාජිකයකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සෙක් වන්නේ ය.

(8) මණ්ඩලයේ යම් සාමාජිකයකු, ස්වකීය ධුර කාලය ඉකුත් වීමට පෙරාතුව ධුරය හිස් කළහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා, තමාගේ ධුර කාලය ඉකුත් වීමට පෙරාතුව ධුරය හිස් කළහොත් මිස, ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(9) මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක්, එහි සාමාජිකත්වයෙහි පුරප්පාඩුවක් තිබීමේ හේතුව හෝ එහි සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් අවිධිමත් භාවයක් තිබීමේ හේතුව නිසාම නිර්බල නොවන්නේ ය.

(10) මණ්ඩලයේ කටයුතු පවත්වා ගෙන යාම පිළිබඳව මණ්ඩලය විසින් රීති මගින් විධිවිධාන සලස්වා ගත හැකි ය.

මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

6. අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරන යම් ආකාරයකින් සහ යම් අනුප්‍රමාණ අනුව මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවිය යුතු ය.

7. මණ්ඩලයේ පරමාර්ථ පහත දැක්වේ:— මණ්ඩලයේ පරමාර්ථ.

(අ) විශේෂයෙන් ම රෝගාතුර වූ හෝ මරණය සිදු වූ අවස්ථාවක දී නාවිකයන්ට හෝ ඔවුන්ගේ යැපෙන්නන්ට මුදලින් ආධාර සැපයීම සඳහා විධිවිධාන සැලසීම;

(ආ) නැවක සේවයෙහි නියුක්තව සිටිය දී සිදු වන හදිසි අනතුරක ප්‍රතිඵලයක් වශයෙන් ශිලන්වන, අබලතාවට පත්වන හෝ අන්‍යාකාරයකින් ඒ නැවෙහි සේවය කිරීමෙන් වැළැක්වෙන නාවිකයන්ට සානුකම්පිත ලෙස මුදලින් ආධාර සැපයීම සඳහා විධිවිධාන සැලසීම;

(ඇ) උසස් අධ්‍යාපනය ලැබීමට අදහස් කරන නාවිකයන්ට සහ තම දක්ෂතා වැඩි දියුණු කර ගැනීමට බලා පොරොත්තු වන නාවිකයන්ට මුදල් ආධාර සැපයීමට විධිවිධාන සැලසීම;

(ඈ) විදේශීය වරායවල අතර මං වන නාවිකයන්ට මුදල් ආධාර සැපයීම සඳහා විධිවිධාන සැලසීම; සහ

(ඉ) යම් යාත්‍රාවක සේවය කරන අතරතුර දී අබලතාවට පත් වූ හෝ මරණීය අනතුරකට පාත්‍ර වූ නාවිකයන්ගේ දරුවනට ශිෂ්‍යත්ව දීම සඳහා විධිවිධාන සැලසීම;

(ඊ) මේ වගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) යන ඡේදවල නිශ්චය කොට දක්වා ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ හිතකර වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීම.

8. ස්වකීය පරමාර්ථ ක්‍රියාත්මක කිරීමට යුක්ති සහගත ලෙස අවශ්‍ය වන බලතල සහ කර්තව්‍ය මණ්ඩලයට තිබිය යුතු අතර, මණ්ඩලය විසින් විශේෂයෙන් ම— මණ්ඩලයේ බලතල.

(අ) අරමුදලට දායක මුදල් වශයෙන් මේ පනත යටතේ ගෙවනු ලබන සියලු මුදල් ද අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායම් ද බාර ගත යුතු අතර, ඒ සියලු මුදල් සහ ආදායම් අරමුදලට බැර කළ යුතු ය;

(ආ) අරමුදලේ මුදල්වල භාරය දැරිය යුතු ය;

(ඇ) මණ්ඩලය විසින් සහතික කරනු ලබන තැනැත්තන්ට, මේ පනත යටතේ ඒ තැනැත්තන් හිමිකම් ලබන ප්‍රතිලාභ ගෙවිය යුතු ය;

(ඈ) මේ පනතේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන අරමුදලේ මුදල්, යෝග්‍ය යැයි මණ්ඩලය විසින් සලකනු ලැබිය හැකි කොටස්වල හෝ සුරැකුම්පත්වල ආයෝජනය කළ හැකි අතර ඒ කොටස් හෝ සුරැකුම්පත් විකිණීම ද කළ හැකි ය;

(ඉ) අරමුදල පිළිබඳව සාමාන්‍ය ගිණුමක් පවත්වා ගෙන යා යුතු ය;

(ඊ) අරමුදලට අදාළ ගිණුම් පොත් එක් එක් අවුරුද්දේ දෙසැම්බර් මස තිස් එක්වන දිනට තුලනය කිරීමට සැලැස්විය යුතු ය;

(උ) අරමුදල සම්බන්ධයෙන් එක් එක් වර්ෂය සඳහා, ලැබීම් සහ ගෙවීම් ප්‍රකාශයක් ද ආදායම් සහ වියදම් ප්‍රකාශයක් ද වත්කම් හා බැරකම් ප්‍රකාශයක් ද එක් එක් ආයෝජනයේ ප්‍රකාශිත අගය, ගත් මිල සහ වෙළෙඳ අගය දක්වමින් ආයෝජන පිළිබඳ ප්‍රකාශයක් ද පිළියෙල කිරීමට සැලැස්විය යුතු ය;

(ඌ) එක් එක් වර්ෂය සඳහා (උ) ඡේදය යටතේ පිළියෙල කරන ලද එක් එක් ප්‍රකාශයේ පිටපතක්, ඊළඟ වර්ෂයේ සැප්තැම්බර් මස තිස්වන දිනට පෙර අමාත්‍යවරයා වෙත යැවිය යුතු ය;

(එ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සහ බලාත්මක කිරීම සඳහා එක් එක් වර්ෂය තුළ මණ්ඩලය දැරූ වියදම්, අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ඒ ඒ වර්ෂය සඳහා ලත් ආදායමෙන් අඩු කළ යුතු ය;

(ඒ) දේශීය ප්‍රභවයන්ගෙන් වුවද විදේශීය ප්‍රභවයන්ගෙන් වුවද මුදලින් හෝ අන්‍යාකාරයකින් ලැබෙන ප්‍රදාන, ත්‍යාග සහ පරිත්‍යාග බාරගත හැකි ය;

(ඔ) කවර හෝ චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට නැතහොත් කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම සහ විකිණීම නැතහොත් අන්‍යාකාරයකින් බැහැර කිරීම කළ හැකි ය;

(ඕ) මේ පනත යටතේ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහාත් කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහාත් මණ්ඩලයට අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කළ හැකි ය.

II වන කොටස

මුදල්

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.

9. (1) ලිත් වර්ෂය, මණ්ඩලයේ මුදල් වර්ෂය විය යුතු ය.

(2) මණ්ඩලය විසින් මණ්ඩලයේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීමට සැලැස්විය යුතු ය.

(3) ගිණුම් විගණනය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ ඇති විධිවිධාන මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

අරමුදලේ මුදල් ආයෝජනය කිරීම.

10. අරමුදලට අයත් යම් මුදලක් මණ්ඩලය විසින් නිශ්චය කරන යම් ආකාරයකට, මණ්ඩලය විසින් ආයෝජනය කළ හැකි ය.

අරමුදල ඇතැම් බදුවලින් නිදහස් කිරීම.

11. (1) අරමුදල, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු යම් ආදායම් බද්දක් හෝ ධන බද්දක් ගෙවීමෙන් නිදහස් වන්නේ ය.

(2) යම් තැනැත්තකු විසින් අරමුදලට ත්‍යාගයක් දෙනු ලැබූ අවස්ථාවක, ඔහු ඒ ත්‍යාගයේ සම්පූර්ණ වටිනාකමේ ප්‍රමාණයට, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ තෑගි බද්ද ගෙවීමෙන් නිදහස් විය යුතු ය.

(3) යම් තැනැත්තකු විසින් අරමුදලට පරිත්‍යාගයක් කරනු ලැබූ අවස්ථාවක, ඒ පරිත්‍යාගය, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා අනුමත වියදමක් ලෙස සැලකිය යුතු අතර ඒ ත්‍යාග දීමනාකරුට ඒ පරිත්‍යාගයේ සම්පූර්ණ වටිනාකම වෙනුවෙන් එකී පනත යටතේ සහන ලැබීමට හිමිකම් තිබිය යුතු ය.

(4) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතෙහි පටහැනිව කවර විධිවිධානයක් තිබුණ ද මේ වගන්තියේ විධිවිධාන බල පැවැත්විය යුතු ය.

III වන කොටස

දායක මුදල්

12. (1) 13 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අරමුදලට දායක මුදල් ගෙවීමට නාවිකයකු ප්‍රථමයෙන්ම යටත් වන අවස්ථාවක, ඔහු අරමුදලේ සාමාජිකයකු වන අතර, ඉන් ඉදිරියට අරමුදලේ සාමාජිකයකුව සිටිය යුතු ය. අරමුදලේ සාමාජිකත්වය.

(2) අරමුදලේ සාමාජිකයකුට හෝ සාමාජිකයකු යටතේ හිමිකම් පාන කවර හෝ තැනැත්තකුට, මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක හෝ යම් කිසි විධිවිධානයක් ප්‍රකාර හැර, අන්‍යාකාරයකින්, අරමුදලේ මුදල්වලට කිසියම් සම්බන්ධතාවක් හෝ හිමිකමක් හෝ නොතිබිය යුතු ය.

13. (1) මේ පනත අදාළ වන නාවිකයකු, ඔහු මුහුදු යන යාත්‍රාවක සේවය කරන එක් එක් මාසය වෙනුවෙන්, ඒ මාසයේ ඔහුගේ අතිකාල ඉපයීම් හැර, මුළු ඉපයීම් වලින් සියයට දෙකකට සමාන දායක මුදලක්, අරමුදලට ගෙවීමට යටත් වන්නේ ය. සාමාන්‍ය දායක මුදල්.

(2) මේ පනත අදාළ වන්නා වූ ද අරමුදලට දායක මුදල් ගෙවීමට යටත් වන්නා වූ ද සෑම නාවිකයකුගේ ම සේවායෝජකයකු, ඒ ඒ සේවායෝජකයා යටතේ ඒ නාවිකයා සේවයේ නියුක්ත කරනු ලබන එක් එක් මාසය වෙනුවෙන්, ඒ මාසයේ දී ඒ නාවිකයාගේ අතිකාල ඉපයීම් හැර, මුළු ඉපයීම්වලින් සියයට තුනකට සමාන දායක මුදලක්, ඊළඟ මාසයේ අවසාන දිනයට කලින් අරමුදලට ගෙවීමට යටත් වන්නේ ය.

14. අරමුදලට දායක මුදල්— අරමුදලට දායක මුදල්.

(අ) නාවිකයන්ගෙන් සහ ඒ නාවිකයන්ගේ සේවායෝජකයන්ගෙන් දායක මුදල් වශයෙන් මණ්ඩලය විසින් බාරගත යුතු ය;

(ආ) ශ්‍රී ලංකාව ඇතුළත වුවද ශ්‍රී ලංකාවෙන් පිටත වුවද කවර වූ හෝ ප්‍රභවයකින් ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් මණ්ඩලය විසින් බාරගත යුතු ය ;

(ඇ) ආයෝජනවල ආදායම වශයෙන් මණ්ඩලය විසින් බාරගත යුතු ය.

දායක මුදල් මත පොලිය ගෙවීම.

15. එක් එක් වර්ෂය සඳහා මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව කලින් කල නියම කරනු ලබන්නා වූද සියයට තුනකට අඩු නොවන්නා වූ ද යම් ප්‍රමාණයක පොලියක්, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක්වන දිනට අරමුදලේ මුදල් ආයෝජනයෙන් ලබා ඇති ආදායමින්, ගෙවනු ලැබිය යුතු ය.

අරමුදලින් මුදල් ගෙවීම.

16. (1) මණ්ඩලය විසින්, 7 වන වගන්තියේ නිශ්චය කොට දක්වා ඇති පරමාර්ථ ඉටුකර ගැනීමෙහිලා සහ අරමුදලෙන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණ තක්සේරු කිරීමෙහිලා, අදාළ නාවිකයා විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලුම් පත්‍රයේ ගෙන හැර දක්වා ඇති සියලු කරුණු ගැන සැලකිලිමත් වෙමින්, යුක්ති සහගත වන මුදල් ආධාර සැපයිය යුතු ය.

(2) මණ්ඩලය විසින් තක්සේරු කරන ලද මුදල් ප්‍රමාණය, ඉන් අනතුරුව හැකිතාක් ඉක්මණින් ඒ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ නාවිකයාට හෝ ඔහු මියගොස් ඇත්නම්, ඔහුගේ උරුමක්කාරයන්ට, අද්මිනිස්ත්‍රාසිකාරයන්ට හෝ පැවරුම්ලාභීන්ට ගෙවනු ලැබිය යුතු ය.

යම් දායක මුදලක් ගෙවා නොමැති විට සේවා යෝජකයා අධිභාරයක් ගෙවිය යුතු බව.

17. මේ පනත යටතේ ගෙවිය යුතු දායක මුදලක් එය ගෙවිය යුතු දිනය වන විට අරමුදලට ගෙවා නොමැත්තා වූ ද ඒ දායක මුදල ගෙවීම පැහැර හැරීම තමාගේ පාලනය ඉක්ම වූ අවස්ථාගත කරුණු හේතු කොට ගෙන සිදු වූ බ්වට මණ්ඩලය සෑහීමට පත්වන පරිදි පැහැදිලි කිරීමට සේවායෝජකයා අපොහොසත් වන්නා වූ ද අවස්ථාවක, ඒ දායක මුදලට අතිරේකව, මෙහි පහත දැක්වෙන පරිදි ගණන් බලන ලද ප්‍රමාණයක අධිභාරයක් අරමුදලට ගෙවීමට ඒ සේවායෝජකයා බැඳී සිටින්නේ ය :—

(අ) දායක මුදල එක් මාසයක් නොඉක්මවන කාලසීමාවක් හිඟ හිටවා ඇති අවස්ථාවක ඒ දායක මුදලෙන් සියයට දහයක අධිභාරයක් ;

(ආ) දායක මුදල, එක් මාසයක් ඉක්මවන එහෙත් මාස තුනක් නොඉක්මවන කාල සීමාවක් හිඟ හිටවා ඇති අවස්ථාවක, ඒ දායක මුදලෙන් සියයට පහළොවක අධිභාරයක් ;

(ඇ) දායක මුදල, මාස තුනක් ඉක්මවන එහෙත් මාස හයක් නොඉක්මවන කාල සීමාවක් හිඟ හිටවා ඇති අවස්ථාවක, ඒ දායක මුදලෙන් සියයට විස්සක අධිභාරයක් ; සහ

(ඈ) දායක මුදල, මාස හයක් ඉක්මවන කාලසීමාවක් හිඟ හිටවා ඇති අවස්ථාවක, ඒ දායක මුදලෙන් සියයට විසිපහක අධිභාරයක්.

IV වන කොටස

මණ්ඩලයේ කාර්ය මණ්ඩලය

නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.

18. (1) මණ්ඩලයේ කර්තව්‍යයන් කාර්යක්ෂමව ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය යැයි මණ්ඩලය සලකන වෙනත් නිලධරයන් සහ සේවකයන් මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ නිලධරයන්ට සහ සේවකයන්ට, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයකින් සහ ප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන සේවා කොන්දේසිවලට ඔවුන් යටත් විය යුතු ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු මණ්ඩලයේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(4) රජයේ සේවයේ යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(5) රජයේ සේවයේ යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(6) නියමිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයෙහි යොදවනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මණ්ඩලයට සේවය කරනු ලබන යම් කාලයක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) මණ්ඩලයේ ඉල්ලීම පිට පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු, අවස්ථාවෝචිත පරිදි ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ අවස්ථාවෝචිත පරිදි පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ ඒ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එබඳුම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි කාලයක් සඳහා, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ කොන්දේසි ද ඇතුළුව මණ්ඩලය හා අවස්ථාවෝචිත පරිදි පළාත් පාලන

සේවා උපදේශක මණ්ඩලය හෝ පළාත් පාලන ආයතනය එකඟ වන නියමයන් හෝ කොන්දේසි පිට, එම සාමාජිකයා, නිලධරයා හෝ සේවකයා, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(8) මණ්ඩලයේ ඉල්ලීම පිට, රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ රාජ්‍ය සංස්ථාවේ පාලන මණ්ඩලයේ ද කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් මණ්ඩලය හා එකී රාජ්‍ය සංස්ථාව එකඟත්වය කට එළඹෙන, විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ නියමයන් හා කොන්දේසි ද ඇතුළු නියමයන් හා කොන්දේසි මත, ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(9) (7) වන උපවගන්තිය හෝ (8) වන උපවගන්තිය ප්‍රකාර යම් තැනැත්තකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම යටත් විය යුතු ය.

V වන කොටස

සාමාන්‍ය විධිවිධාන

මණ්ඩලයේ සාමාජිකයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

19. දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා, මණ්ඩලයේ සියලුම සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

20. අල්ලස් පනතේ අර්ථානුකූලව මණ්ඩලය, උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

මණ්ඩලයට සාමාන්‍ය හෝ විශේෂ විධාන දීමට අමාත්‍ය වරයාට බලය ඇති බව.

21. (1) මණ්ඩලයේ කාර්ය ඉටු කිරීම පිළිබඳව ද බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව ද විශේෂ හෝ සාමාන්‍ය ලිඛිත විධාන අමාත්‍යවරයා විසින් දෙනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුතු ය.

(2) මණ්ඩලයේ වැඩ කටයුතු පිළිබඳව තමාට අවශ්‍ය විය හැකි යම් තොරතුරු තමා වෙත ලිඛිතව සපයන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල, මණ්ඩලයට විධාන කළ හැකි ය.

22. (1) (අ) මේ පනත යටතේ මණ්ඩලය විසින් සද්භාවයෙන් කරන ලද නැතහොත් කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පරිදි හෝ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද නැතහොත් කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව

කවර වූ හෝ සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නො ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පරිදි කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව.

(2) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පරිදි හෝ (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ දී ඔහුට විරුද්ධව ගෙනෙන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දක් යැයි අධිකරණය පිළිගතහොත්, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

23. මණ්ඩලයට විරුද්ධව ගෙනෙන ලද යම් නඩුවක දී පුද්ගලයකු වශයෙන් මණ්ඩලයේ සාමාජිකයකුට විරුද්ධව හෝ ඔහුගේ දේපළවලට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් කරනු නො ලැබිය යුතු ය.

පුද්ගලයකු වශයෙන් මණ්ඩලයේ සාමාජිකයකුට විරුද්ධව හෝ ඔහුගේ දේපළවලට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

24. (අ) මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක හෝ විධිවිධාන කඩ කරන ; හෝ

(ආ) මේ පනතේ කාර්ය සඳහා, තමාගේ දැනීම අනුව, අසත්‍ය හෝ වැරදි යම් තොරතුරක් සපයන්නා වූ නැතහොත් අන්තර්ගත කරුණු හෝ අන්තර්ගත කරුණුවලින් කොටසක් හෝ අසත්‍ය හෝ වැරදි බව තමා දන්නා යම් ලේඛනයක් සපයන්නා වූ

යම් තැනැත්තෙක් වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකදී වරදකරු කරනු ලැබුවහොත් මාස හයකට නොවැඩි කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

වැරදි.

25. (1) නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති යම් කරුණක් සම්බන්ධයෙන් හෝ නියම කළ යුතු යැයි මේ පනතින් නියමිත යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

නියෝග.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයෙහි නිශ්චය කොට දැක්වෙන වෙනත් යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම එසේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනට පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර එසේ අනුමත කරනු නො ලැබූ යම් නියෝගයක්, එය යටතේ එතෙක් කරන ලද කිසිවකට හානියක් නොමැතිව ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ සේ සැලකිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ සේ සැලකෙන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපනය.

26. මේ පනතෙහි, පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස—

"නාවිකයා" යන්නෙහි, 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.